## 1.1 හැඳින්වීම :

වර්තමාන ගෝලීය සමාජ , ආර්ථික, දේශපාලන සන්දර්භය තුළ ජනමාධ්‍ය යනු සමාජ දේහය හා අවියෝජනීයව බැඳී පවතින සංකීර්ණ ප්‍රපංචයක් ලෙස හැඳින්විය හැකිය. ආදි කල්පිත මානවයාගේ ප්‍රාථමික සන්නිවේදන ක්‍රියාවලියෙන් ඇරඹී භාෂණය , ලේඛනය බිහිවීමත් සමඟ ක්‍රමිකව වර්ධනය වූ මානව සන්නිවේදන ක්‍රියාවලිය පුවත්පත, ගුවන්විදුලිය හා රූපවාහිනිය වැනි අවධින් පසු කරමින් නූතනය වන විට ඩිජිටල් ස්වරූපයක් දක්වා වර්ධනය වී තිබේ.

ආර්ථික විද්‍යාව , දේශපාලන විද්‍යාව වැනි සමාජ විද්‍යාත්මක විෂයයන් හුදු විෂයයන් ලෙස ආකස්මිකව පහළ වූ ඒවා නොවේ. එනම් අදාළ ක්ෂේත්‍රයේ ක්‍රමික වර්ධනයන්හි ප්‍රතිඵලයක් ලෙස බිහි වූ අධ්‍යයන ක්ෂේත්‍රයන් වේ.සන්නිවේදන ක්‍රියාවලියේ පරිණාමයේ එක්තරා අවස්ථාවක දී එහි අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස ජනසන්නිවේදන අධ්‍යයනය ( Mass communication studies) බිහි විය. පසුකාලීනව සන්නිවේදන ක්‍රියාවලිය ජනමාධ්‍යයන් සතු වීමත් සමඟ ම ජනමාධ්‍ය පිළිබඳ විද්‍යාත්මක හැදෑරීමේ විෂය ක්ෂේත්‍රය ලෙස ජනමාධ්‍යවේදය බිහි විය. ආචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ හා වියුධර් විරසිංහ (2002) ට අනුව සෑම විද්‍යාවකටම විෂය පසුතලය සංවර්ධනයේ දී එහි ප්‍රායෝගික හා න්‍යායික පරිසරය පුළුල් වන අතර එසේ ඇති වන නව තත්ත්වයන් පිළිබඳව පර්යාවලෝකනය කිරීමට සිදුවේ.

මානව සන්නිවේදනය යනු ශතවර්ෂ ගණනාවක් තිස්සේ වර්ධනය වුවක් වුවද ඒ පිළිබඳව විද්‍යාත්මක අධ්‍යයනයන් ඇරඹෙන්නේ විසි වන සියවසේ ආරම්භයේ පමණ සිටය. දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රය ඇමරිකා එක්සත් ජනපදයේ මුල් බැස ගත්තද සන්නිවේදන අධ්‍යයන කටයුතු වල ආරම්භය ඊට දශක 30 ක් පමණ ඔබ්බට දිව යයි. ඇමරිකානු විශ්වවිද්‍යාල වල සන්නිවේදන අධ්‍යයන කටයුතු ඇරඹීමට මහාචාර්ය විල්බර් ශ්‍රාම් පුරෝගාමී විය. ඩේවිඩ් බර්ලෝ ,ජෝර්ජ් ගබ්නර්, මෙල්වින් ඩිෆ්ලුවර් වැන්නන් එක්සත් ජනපදයේ ජනසන්නිවේදන අධ්‍යයනය පුළුල් කිරීමට දායක වූ අතර මිනසෝටා , විස්කොන්සින් හා පෙන්සිල්වේනියා වැනි විශ්වවිද්‍යාල වලින් ද සන්නිවේදන අධ්‍යාපනය ව්‍යාප්ත කිරීමට ප්‍රබල දායකත්වයක් ලැබිණ. යුරෝපයේ සන්නිවේදන අධ්‍යාපනයේ ව්‍යාප්තිය 1970 දශකයේ සිට ප්‍රබලව සිදු වන්නට විය. පින්ලන්තයේ ටැම්පරේ සරසවියේ කාල් නොඩන්ස්ට්‍රෙන්ග් හා ඇමෙස්ටර්ඩෑම් සරසවියේ ඩෙනිස් මැක්වේල් ඒ සඳහා පුරෝගාමී විය.(කරුණානායක , 2003) මේ ආකාරයට වර්ධනය වන බටහිර සන්නිවේදන මාධ්‍ය අධ්‍යාපනය වර්තමානය වන විට අතිශය පුළුල් පරාසයක විහිදුන විෂයක් බවට පත්ව තිබේ. මෙහි දී දැක ගත හැකි සුවිශේෂ ලක්ෂණය නම් ඇමරිකානු හා යුරෝපීය විශ්වවිද්‍යාල වල හුදු ඉගැනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතික්‍රමණය කොට

සන්නිවේදන මාධ්‍ය විෂයේ න්‍යායික හා සංකල්පීය ව්‍යූහයන් සියුම්ව අධ්‍යයනය කළ බවයි. එම රටවල විශ්වවිද්‍යාල වල බුද්ධිමතුන් විසින් පළ කොට ඇති ශාස්ත්‍රීය නිබන්ධනයන් ඒ බව මොනවට පැහැදිලි කරයි.

ශ්‍රී ලංකාවෙ සන්නිවෙදන අධ්‍යාපනය 1969 දී කණිෂ්ඨ විද්‍යාල වල ඇරඹුන අතර මුල්ම ජනසන්නිවේදන අධ්‍යයන අංශය 1973 කැළණිය විශ්වවිද්‍යාලයේ ආරම්භ කෙරිණ. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 1987 වසරේ ලේඛකත්ව හා ජන සන්නිවේදන ඩිප්ලෝමා හා පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා ආරම් විය. එමෙන්ම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිංහල ගෞරව උපාධියට සමාන්තරව ජනසන්නිවේදනය පිළිබඳව ගෞරව උපාධි පාඨමාලාවක් ද පැවැත්වේ. කොළඹ විශ්වවිද්‍යාලයේ ද ජනසන්නිවේදන ඒකකයක් ක්‍රියාත්මක වන අතර එමඟින් ගෞරව උපාධි පාඨමාලා මෙන් ම සති අන්ත ජනසන්නිවේදන ඩිප්ලෝමා පාඨමාලා ද පවත්වා ගෙන යයි. ජනමාධ්‍ය විශේෂවේදී ගෞරව උපාධියක් පිරිනමන ලංකාවේ එකම ආයතනය වන්නේ කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ශ්‍රීපාලි මණ්ඩපයයි.

විශ්වවිද්‍යාල මට්ටමින් ලංකාවේ සන්නිවේදන මාධ්‍යය ක්‍රියාත්මක වුව ද එම පාඨමාලාවන් ලාංකේය ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රබල ව දායක වූ ආකාරයක් දැක ගත නොහැකිය. එමෙන්ම ආසියාන් කලාපයේ අනෙකුත් රට වලට සාපේක්ෂව මෙරට ජනසන්නිවේදන විෂය ක්ෂේත්‍රය පිළිබඳ විද්‍යාත්මක ඇකඩමියානු අධ්‍යයනයන් පවතින්නේ අවම මට්ටමකය.

ලංකාවේ මාධ්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයේ දක්නට ලැබෙන ගැටලු වලට ප්‍රධානතම හේතුවක් නම් සන්නිවේදන විෂයේ න්‍යායික හා සංකල්පීය ව්‍යූහයන් මෙරට නිසි පරිදි ස්ථාපිත නොවීමයි. එය එසේ සිදුවීමට බල පෑ හේතු කාරණා අතර අදාළ විෂය පිළිබඳ විද්‍යාත්මක පදනමකින් ලියවුණු ශාස්ත්‍රීය ග්‍රන්ථ නිබන්ධන වල හිඟතාවය දැක්විය හැකිය. මේ පිළිබඳව සිංහල බසින් ලියවුණු පොතපත තිබුණ ද ඒවා බොහොමයක් හුදු තීරු ලිපි රචනය සංස්කරණය හෝ ගුවන් විදුලි වැඩසටහන් නිෂ්පාදනය වැනි මාධ්‍යයේ තාක්ෂණික අංශය පිළිබඳව ලියවුනු ඒවාය. එසේත් නැත්නම් සන්නිවේදන මාධ්‍යයන්ගේ ප්‍රභවය වර්ධනය ඓතිහාසික දෘෂ්ටිකෝණයකින් සාකච්ඡා කෙරෙන කෘතීන්ය. කිසියම් ආකාරයකට හෝ එම අඩුව පිරවීමට උත්සහයක් ගැනීම මෙම නිබන්ධනයේ අරමුණ වේ.

ස්ටැන්ලි ජේ බැරන් හා ඩෙනිස් කේ ඩේවිස් විසින් රචිත ජන සන්නිවේදන න්‍යාය ( Mass communication Theory ) කෘතියේ තෝරා ගත් පරිච්ඡේද කිහිපයක් සිංහල

භාෂාවට පරිවර්තනය හා එම තෝරා ගත් පරිච්ඡේදයන් පිළිබඳ විශ්ලේෂණයක් මෙම නිබන්ධනයේ අන්තර්ගත වේ. ජනසන්නිවේදන න්‍යායන් මාධ්‍ය කර්මාන්තයේ හා බහුජන සමාජ න්‍යායේ පිබිදීම ප්‍රචාරණය ජනමාධ්‍යයේ ප්‍රතිමානක න්‍යායන් හා ජනමාධ්‍යයේ සංස්කෘතික විචාරාත්මක සංකල්ප මෙම නිබන්ධනයේ අන්තර්ගත වේ.

ලංකාවේ ජනසන්නිවේදන හා මාධ්‍ය අධ්‍යාපනය විෂයක් ලෙස නිසි පරිදි ස්ථාපිත නොවීම නිසා උද්ගත වී තිබෙන ගැටලුකාරී අවස්ථා බොහොමයකි. අප සන්නිවේදන අධ්‍යයනයන්හි දී භාවිතා කරන මූලික සංකල්ප සියල්ලක් ම පාහේ බටහිර ශාස්ත්‍රීය නිබන්ධන වලින් පර්යේෂණ වලින් ගන්නා ලද ඒවායි. බොහෝවිට මෙම න්‍යායන් හා සංකල්ප ඉංග්‍රීසියෙන් සිංහලට හුදු පඨිතමය පරිවර්තනයකට පමණක් භාජනය වී තිබේ. Mass යන සංකල්පය ලංකාවේ භාවිතා වන්නේ "ජන" යනුවෙනි. එහෙත් Mass යන්නෙන් බටහිර අධ්‍යයන ක්ෂේත්‍රය අදහස් කරන්නේ ජනස්කන්ධ හෝ ජනරාශී යන්නයි. වර්තමානයේ මෙරට විශ්වවිද්‍යාල පාඨමාලා හැඳින්වීමට පවා ජනසන්නිවේදන ජනමාධ්‍ය යන යෙදුම භාවිතා කරයි.

ජනමාධ්‍ය නිදහස ස්වාධීනත්වය වැනි සංකල්ප කෙතරම් දුරකට මෙරට නිශ්චිතව ස්ථාපිතව ඇත්ද යන්න ගැටලුකාරීය. ජනමාධ්‍ය නිදහස යනු ප්‍රමාණාත්මකව හෝ ගුණාත්මකව මේ තරම් ප්‍රමාණයකින් පැවතිය යුත්තක් යැයි ප්‍රකාශ කළ නොහැකි සංකීර්ණ මාතෘකාවකි. ( Baron Davis,2003) එහෙත් ලංකාවේ වරින් වර ජනමාධ්‍ය නිදහස සම්බන්ධයෙන් ගොඩ නැගෙන කතිකාවන් කිසිදු විද්‍යාත්මක පදනමක් නොමැති හුදු දේශපාලනික න්‍යාය පත්‍ර පදනස කරගත් ඒවා ලෙස සැලකිය හැකිය. කිසිදු මාධ්‍යයක් සමබර නොවන අතර එය කිසියම්ම හෝ පාර්ශවයකට පක්ෂපාතීත්වයක් දක්වයි. එබැවින් සන්නිවේදන හා මාධ්‍යය න්‍යායික සංකල්ප පිළිබඳ විද්‍යාත්මක එළඹුමක අවශ්‍යතාවය වර්තමානයේ දැඩිව මතු වී තිබේ. වර්තමානයේ ජනමාධ්‍ය අධ්‍යයන ක්ෂේත්‍රය ක්‍රියාත්මක වන්නේ සෙසු සමාජ ආර්ථික දේශපාලනික විෂයන් හා අන්‍යෝන්‍ය බැඳීමකින් යුක්තවය. අමෙරිකාව, බ්‍රිතාන්‍ය, ඕස්ට්‍රේලියාව වැනි රටවල ජනමාධ්‍ය පාඨමාලා විශ්ලේෂණය කිරීමේ දී පෙනී යන්නේ සමාජ විද්‍යාව මනෝ විද්‍යාව හා ආර්ථික විද්‍යාව වැනි විෂයන්ගෙන් ද එම පාඨමාලා සංකලනය වී ඇති බවයි. ඕස්ට්‍රේලියාවේ La Trobe විශ්වවිද්‍යාලයේ ජනමාධ්‍ය උපාධි පාඨමාලාවේ විෂය නිර්දේශය ගත් කළ එහි ප්‍රථම වසර පදනම් පාඨමාලා සැකසී තිබෙන්නේ සමාජ විද්‍යාව මනෝ විද්‍යාව හා මානව විද්‍යා විෂයන්ගෙනි. (Latrbe .edu.au,2009.12.14). ලංකාවේ විශ්වවිද්‍යාල වල සන්නිවේදන හා මාධ්‍යය අධ්‍යයන පාඨමාලා විෂය නිර්දේශයන් හි ද යම් තාක් දුරකට සෙසු සමාජ විද්‍යා විෂයන්ට අවස්ථාවක් ලබා දී තිබේ. කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ ජනමාධ්‍යවේදීය සමාජ විද්‍යාව ජනමාධ්‍යවේදයේ මනෝ විද්‍යාව විෂයන් ද කැළණිය විශ්වවිද්‍යාලයේ ජනමාධ්‍යය හා සමාජය හා අන්තර් පුද්ගල සන්නිවේදනය වැනි විෂයන් තිබේ. එහෙත් මෙම පාඨමාලා සිංහල

භාෂාවෙන් ඉගැන්වෙන අතර ඉංග්‍රීසි දැනුමේ හීනතාවය නිසා විද්‍යාර්ථීන්ට අදාළ විෂයන්ගේ සාරය උකහා ගැනීමේ අපහසුතා මතු වී තිබේ.

බටහිර රටවල සන්නිවේදන මාධ්‍යයන් බිහිවන්නේ එම සමාජයන්හි සමාජ විකාශනයේ එක්තරා අවධියක දී මතු වූ අවශ්‍යතාවයක් ලෙසිනි. එයට අදාළ අධ්‍යයන ක්ෂේත්‍රය ද ඊට අනුරූපීව බිහිවිය. ලංකාවේ ගුවන්විදුලිය, රූපවාහිනිය වැනි ජනමාධ්‍යයන් මෙරට සමාජයීය අවශ්‍යතාවයක් නොවූ අතර මෙරටට බාහිරින් ආරෝපණය විය. එනිසා මෙරට සන්නිවේදන මාධ්‍ය භාවිතාව තුළ ඌන සංවර්ධන ලක්ෂණ දක්නට ලැබේ. අපගේ මාධ්‍ය අන්තර්ගතයන් සකස් වී තිබෙන්නේ මෙරට ජනවිඥාණය පාදක කරගෙන නොවන අතර අපට අනන්‍ය නොවන ආකෘති භාවිතය නිසා වර්තමානයේ ගැටලුකාරී තත්ත්වයන් මතු වී තිබේ. මෙම තත්ත්වයන්ගෙන් මාධ්‍යය ක්‍රියාවලිය ප්‍රශස්ථ මට්ටමකට ගෙන ඒම සඳහා න්‍යායික හා සංකල්පීය ප්‍රවේශයක් බෙහෙවින් වැදගත් වේ.

වර්තමානයේ මෙරට පාසල් පද්ධතියට සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය හඳුන්වා දී තිබේ. එමගින් ගම්‍ය වන්නේ එම විෂයේ අධ්‍යයන කටයුතුකෙරෙහි සමාජයීය අවශ්‍යතාවයක් මතු වී ඇති බවයි. එහෙත් අප ඉහත සාකච්ඡා කළ ආකාරයට සන්නිවේදන විෂයේ මූලධර්මීය පදනම හෙවත් න්‍යායික හා සංකල්පීය ව්‍යුහයන් පිළිබඳව විද්‍යාත්මක පදනමකින් තොරව නිවැරදි අධ්‍යයන එළඹුමක් කරා යාම අපහසු කටයුත්තකි. එම නිසා මෙම ශාස්ත්‍රීය නිබන්ධනයෙන් උත්සහ කෙරෙනුයේ මෙම සන්නිවේදන මාධ්‍යය අධ්‍යයන ක්ෂේත්‍රයේ න්‍යායික හා සංකල්පීය ස්වරූපයන් එහි නව ප්‍රවණතාවයක් පිළිබඳවත් කිසියම් හැදෑරීමක් සිදු කිරීමටය. ජනමාධ්‍ය න්‍යාය සම්බන්ධ සම්භාවනාවට පාත්‍ර වූ ශාස්ත්‍රීය කෘතියක් සිංහලයට මෙතෙක් පරිවර්තනය වී නොමැති අතර මෙම නිබන්ධනය ඒ සඳහා ගත් වෑයමක ප්‍රතිඵලයකි.